# දැන්වීමයි

සී/ ස පල්ලේපොල වි.සේ.ස.සමිතියේ පහත තනතුරු සඳහා 2022/11/09 දින දක්වා මාතලේ දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් ගරු **සභාපති , සී/ස පල්ලේපොල වි.සේ.ස.සමිතිය, පල්ලේපොල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලිපි කවරයේ ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතුය.

## සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

**වැ.ප.අ.** : E.L-02:01

**වැ.ප.** : 30,000- 600x10 - 900x10 -1,200x10= 57,000

**වයස් සීමාව** : 18-45

**පුරප්පාඩු සංඛ්‍යාව** : 01

**සුදුසුකම්** :

අ. අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පොත් තබන්නා තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම /ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ආ. ගණකාධිකරණ /බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම සමග අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 ක / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / පොත් තබන්නා තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් /කළමනාකරු (ව්‍යාපෘති) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ගිණුම් සහකාර තනතුරක වසර 06 ක සේවා පළපුරුද්දක් තිබීම.

ඇ. පිළිගත් විශ්ව විද්‍යාලයක / පිළිගත් ආයතනයක ගණකාධිකරණ/වාණිජ/ කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම / උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / වාණිජ / කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වීම.

ඈ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර II ( Charted Level II) /ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර II (A.A.T. Level II ) සමත් වීම.

## සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ)

**වැ.ප.අ.** : E.L-02:03

**වැ.ප.** : 30,000- 600x10 - 900x10 - 1,200x10= 57,000

**වයස් සීමාව** : 18–45

**පුරප්පාඩු සංඛ්‍යාව** : 01

**සුදුසුකම් :**

අ. අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් /ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 07 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම /වෙළඳසැල් (පරිපාලක) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / තොග ගබඩා කළමනාකරු තනතුරක වසර 07 ක ස්ථිර සේවා පළපුරුද්දක්/ කළමනාකරු (සුපිරි වෙළඳසැල්/ කෝප් සිටි/ඉන්ධන/ වෙළඳසැල් ) තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

ආ. පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම සමග අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් /ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් / පොත් තබන්නා තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම /ග්‍රාමීය බැංකු අංශයේ ගිණුම් සහකාර තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

පිළිගත් විශ්වවිද්‍යාලයක/පිළිගත් ආයතනයක ගණකාධිකරණය /වාණිජ විෂයක් ඇතුළත් උපාධියක් සමත් වී තිබීම / උසස් තාක්ෂණ ආයතනයේ වාණිජ/කළමනාකරණ ඩිප්ලෝමාවක් සමත් වී තිබීම.

## සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු)

**වැ.ප.අ.** : E.L-02:02

**වැ.ප.** : 30,000- 600x10 - 900x10 -1,200x10= 57,000

**වයස් සීමාව** : 18-45

**පුරප්පාඩු සංඛ්‍යාව** : 01

**සුදුසුකම් :**

අ. අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පොත් තබන්නා තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / කළමණාකරු (ව්‍යාපෘති) තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ආ. බැංකු කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම සමග අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ස්ථිර සේවා පළපුරුද්දක් / පොත් තබන්නා තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් හෝ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ ග්‍රාමීය බැංකු අංශයේ ගිණුම් සහකාර තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයක/පිළිගත් ආයතනයක ගණකාධිකරණ / වාණිජ කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/ වාණිජ/ කළමනාකරණ ඩිප්ලෝමාව සමත්වීම.

ඈ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර II ( Charted Level II) / ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර II (A.A.T. Level II) සමත් වීම.

**අමුණා එවිය යුතු සහතික පිටපත් :**

- උපැන්න සහතික පිටපත
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ සහතික පිටපත
- අධ්‍යාපන සහතික පිටපත්
- පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත්
- පදිංචිය පිළිබඳ ග්‍රාම සේවක සහතික පිටපත
- මෑතකදී ලබාගත් චරිත සහතික පිටපත් 02 ක්

**විමසීම් : 0664933169-0718322300**

**ගරු සභාපති.**